# ජිනීවා සම්මුති

සහ

# ජාත්‍යන්තර රතුකුරුස සම්මුව

## ශ්‍රී ලංකාවට අදාළවන සැටි

ප්‍රජා අයිතිවාසිකම් ආරක්ෂක පෙරමුණ

මෙහිදී ආශ්‍රය සඳහා පමණි

P 216

ඇතුළත්දේ.

හැඳින්වීම

ජා.ර.කු. කමිටුවේ සහ ජිනීවා ගිවිසුම්වල ආරම්භය.

ජා.ර.කු. කමිටුවේ කාර්යභාරය

ජා.ර.කු. කමිටුවේ කටයුතුවල විශ්වාසනීය භාවය.

අභ්‍යන්තරික ගැටුම් පවතින අවස්ථාවකට යොදා ගැනීමේ හැකියාව.

සන්නද්ධ විපක්ෂ කණ්ඩායම්ද මානුෂික ප්‍රමිතීන් රැකීමට බැඳී සිටිති.

විරෝධ කණ්ඩායම්වලට නිත්‍යානුකූල තත්ත්වයක් අයිති නොවේ.

" අභ්‍යන්තරික " තත්ත්වයන්හිදී ජා.ර.කු. කමිටුව වැඩ කරන සැටි - නිදසුන් කීපයක්

ශ්‍රී ලංකාවේ තත්ත්වයට ජා.ර.කු. කමිටුවේ අදාළකම

OPEN UNIVERSITY OF SRI LANKA
LIBRARY

<u>උප ලේඛන.</u>

1. ජිනීවා ගිවිසුම්වල පොදු 3 වන වගන්තියේ පෙළ
2. ජා.ර.කු. කමිටුව විසින් ශ්‍රී ලංකාවට ආධාර පිරිනැමීම
*3. වෙනත් ස්ථානයන්හි " අභ්‍යන්තරික " තත්ත්වයන් තුළ ජා.ර.කු. කමිටුව වැඩ කරන සැටි - නිදසුන් කීපයක්
*4. ජාත්‍යන්තර රතුකුරුස ව්‍යාපාරයේ ව්‍යුහය සහ රතුකුරුසයේ ප්‍රතිපත්ති.
5. සන්නද්ධ ගැටුම්වලදී ජාත්‍යන්තර මානුෂීක නීතියේ මූලධර්මයන්හි සාරාංශය
*6. ජිනීවා ගිවිසුම්වලට අමතර ගිවිසුම් II ( අභ්‍යන්තරික සන්නද්ධ ගැටුම් තත්ත්වයකට අදාළ )
*7. ජිනීවා ගිවිසුම්වල සහ ඒවාට අමතර ගිවිසුම්වල පාර්ශවයන් වන රාජ්‍යයන් පෙන්නුම් කරන වගුව.
*8. ගිවිසුම ව්‍යාප්ත කිරීමෙහිලා රාජ්‍ය පාර්ශවයන් වෙත පැවැරී ඇති බැඳීම්
*9. ප්‍ර.අ.ආ. පෙරමුණ වෙතින් ලබා ගැනීමට හැකි, ජා.ර.කු. කමිටුව හා ජිනීවා ගිවිසුම් පිළිබඳ ප්‍රකාශන ලැයිස්තුව
10. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ කමිසම සම්මත කළ 1987 මාර්තු යෝජනාවේ පෙළ

(* මෙම උපලේඛන මෙයට ඇතුළත් කැර නැත. ඒවායේ ඉංග්‍රීසි පිටපත් පමණක් ප්‍ර.අ.ආ. පෙරමුණෙන් ලබා ගැනීමට හැකිය.)

ජිනීවා ගිවිසුම් සහ ජාත්‍යන්තර
රතුකුරුස කමිටුව ශ්‍රී ලංකාවේ
වත්මන් තත්ත්වයට අදාළ වකපැටි.

ප්‍ර. අ. ආ. පෙරමුණේ වාර්තාවෙකි.

## හැඳින්වීම.

ජාත්‍යන්තර රතුකුරුස (ජා. ර. කු.) කමිටුව, සිවිල් යුද්ධ හා අභ්‍යන්තරික කලබලද ඇතුළු සන්නද්ධ ගැටුම් පවතින අවස්ථාවන්හිදී මානුෂික කරුණු සම්බන්ධයෙන් මධ්‍යස්ථ මැදිහත්වන්නකු වශයෙන් සුවිශේෂවූත්, දීර්ඝ කාලයෙක සිට පැවැතෙන්නාවූත් තත්ත්වයක් දරයි. ශ්‍රී ලංකාවද 1959 සිටම පාර්ශවයක් වන ජිනීවා ගිවිසුම්වල, නිශ්චිත, පැහැදිලි තත්ත්වයක් එයට දී තිබේ. ශ්‍රී ලංකාවේ පවතින ශෝචනීය තත්ත්වය සැලැකිල්ලට ගත්, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිසුමේ, සාමාජික රාජ්‍යයන් " මුළු ලෝකයම පිළිගෙන තිබෙන මානුෂික නීතියේ මූලධර්මවලට සම්පූර්ණයෙන්ම ගරු කරන ලෙස " මෙම වසරේ මාර්තුවේ මුළු දුන් එම කමිසුමේ 43 වන සැසිවාරයේදී ඒකමතික එකඟතාවෙකින් සම්මත කළ යෝජනාවක් මගින් " සියලුම පාර්ශවයන්ගෙන් හා කණ්ඩායම් වලින් ඉල්ලා සිටිමින්,

" සියලු පාර්ශවයන්හි පීඩාවට ගොදුරුවූවනට ආධාර හා ආරක්ෂාව සැපැයීමද ඇතුළු මානුෂික ප්‍රමිතීන් ආරක්ෂා කිරීමේ සිය කාර්ය භාරය සපුරා ලීමට ජාත්‍යන්තර රතුකුරුස කමිටුව පිරිනමා තිබෙන සේවාවන් පිළිගැනීම සතුටුදායක ලෙස සලකා බලන ලෙස ද" ඇරියුම් කළේය.

ගැටුමේ පීඩාවට ගොදුරුවූවනට ආධාර සහ ආරක්ෂාව සැපැයීමේ සිය සම්ප්‍රදායික කාර්යයන් ඉටුකිරීමට, ජා. ර. කු. කමිටුව විසින්ම මෙයට කලින් වසර ගණනාවක් තිස්සේද ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට පුන පුනා සිය සේවාවන් පිරිනමා තිබේ. පිරිනැමුණු එම සේවාවන්

අතීතයේදී ප්‍රතික්ෂේප කරනු ලැබුවේ, ජා.ර.කු. කමිටුවේ කාර්ය භාරය හා ස්වභාවය පිළිබඳවත්, කමිටුවට, මෙහි ක්‍රියාත්මක වීමට අවසර දීමෙන් මතුවිය හැකි ප්‍රශ්න පිළිබඳවත්, තිබුණු වැරදි සංකල්ප නිසා බව පෙනෙන්නට තිබේ. ඒවා පැහැදිලි කැර ගත යුතුය. එමෙන්ම, මානව අයිතිවාසිකම් හා සාධාරණත්වයත්, සාමයත් සම්බන්ධයෙන් උනන්දුවන ශ්‍රී ලංකාවේ සියලුම කණ්ඩායම්, ජා.ර.කු. කමිටුවේ කාර්යභාරය දැන හැඳිනගැනීමත්, සන්නද්ධ ගැටුම් වලින් විපතට පත්වූවනට සහන සැපැයීමෙහිලා තමන් සතු විශේෂ හැකියාවන් යෙදවීමට ඉදිරිපත් වන, මෙම මධ්‍යස්ථවූත් මානුෂිකවූත්, සංවිධානය පිරිනමන සේවාවන් පිළිගන්නා ලෙස ආණ්ඩුවට ඇවිටිලි කිරීමත් වැදගත්ය.

UNIVERSITY OF SRI LANKA LIBRARY

## ජා.ර.කු. කමිටුවේ සහ ජිනීවා ගිවිසුම්වල ආරම්භය.

ජා.ර.කු. කමිටුව වසර එකසිය විසි පහක් පමණ පැරණිය. එය ආණ්ඩුවලට හෝ දේශපාලනයට හෝ සම්බන්ධ නැත. එය ආරම්භවූයේ , බරපතල තුවාල ලැබූ සොල්දාදුවන් නියත මරණයට ගොදුරුවන ලෙසින් කිසිම පිළියමක් නොකැර අත්හැර ඇමුණු, 19 වන සියවසේ යුරෝපයේ යුද බිම්වල සිදුවූ මිනිස් සංහාරය නිසා ජනිතවූ සානුකම්පික ප්‍රතිචාරයේ ප්‍රතිඵලයක් වශයෙනි. ජා.ර.කු. කමිටුවේ ආරම්භකයෝ තමන් කරන හුදු සහන සැපැයීමේ කටයුතුවලට පමණක් සීමා නොවූහ. තුවාල ලැබ රෝගාතුර වන සොල්දාදුවන් කුමන පාර්ශවයකට අයත් වූවත් ඔවුන්ගේ ජීවිත බේරා ගැනීමේ සහ ඔවුනට සැලකීමේ යම්, යම්, අවම ප්‍රමිතීන්වලට ආණ්ඩු එකඟ කැර ගැනීමේ ඓතිහාසික මූලිකත්වය ගත්තේද ඔහුය. මුහුදු යුද්ධවලදී විපතට පත්වන අයට සහ යුද සිරකරුවනටද, යුද්ධවලින් පීඩාවට පත්වන සිවිල් ජනතාවටද බලපාන පරිදි එම ගිවිසුම් පසුව ව්‍යාප්ත කරනු ලැබීය. ජාත්‍යන්තර මානුෂික නීතිය නමින් හැඳින්වෙන මෙම සම්පූර්ණ නීති පද්ධතිය , දැන් 1949 ජිනීවා ගිවිසුම් හතරෙන් ද, ගිවිසුමට, ලියවිලි නමින් හැඳින්වෙන 1977 අතිරේක ගිවිසුම් දෙකෙහිද, අන්තර්ගත කරනු ලැබ තිබේ.

පිළිපැදීමට, රාජ්‍යයන් බැඳෙන ජාත්‍යන්තර නීති ක්‍රමයක් බිහිකිරීමේ සුවිශේෂ ජයග්‍රහණය අත්කැර ගැනීමේ ගෞරවය , ආණ්ඩුවේ නොවන, මානුෂික සංවිධානයක් වන, ජා.ර.කු. කමිටුවට එලෙස හිමිවන්නේය. ඒ අතරම, ජිනීවා ගිවිසුම්ද, යුද ගැටුම් සමයන්හිදී ජා.ර.කු. කමිටුව වෙත පැවරෙන කාර්යභාරය ගැන පැහැදිලිවම සඳහන් කරයි.

## ජා.ර.කු. කමිටුවේ කාර්යභාරය.

සියලුම සාමාජිකයන් ස්විස් පුරවැසියන් වන, මධ්‍යස්ථ හා පෞද්ගලික සංවිධානයක් වන ජා.ර.කු. කමිටුව, තමන් මූලිකත්වය ගැනීමෙන් බිහිවූ ජිනිවා ගිවිසුම්වලට අත්සන් තබා ඇති රාජ්‍යයන් එම ගිවිසුම් නිසි ලෙස ක්‍රියාත්මක කිරීම මෙහෙයැවීමේ කාර්යයට වගකිව යුතුය. එයටද අමතරව, යුද ගැටුම්වලින් විපතට පත්වූවන්ගේ යහපත පිණිස ස්වකීය සේවාවන් යුද කරන අයට පිරිනැමීමට , ජා.ර.කු. කමිටුව අතිශයින්ම සුදුසු බවට පත්වැ සිටී. එයට නියම හේතුව කමිටුවේ මධ්‍යස්ථ භාවයයි.

ජා.ර.කු. කමිටුව මුලින්ම, ක්‍රියා කරනුයේ තුවාල ලැබූවනට, රෝගීවූවනට සහ නැවී අනතුරුවලට ගොදුරුවූ සන්නද්ධ හමුදා සාමාජිකයනට හා යුද සිරකරුවනට උපකාර කිරීමටය. යුද සිරකරුවන්ගේ තත්ත්වයන්, සිර අඩස්සියේ සිට ඔවුන් නිදහස් කිරීම දක්වා දියුණු කිරීමට කමිටුව යත්න දරන්නේය. මෙම කාර්යය සඳහා එය, අඩස්සි ප්‍රදේශ හා සිර කඳවුරු සොයා බැලීමටද, පුද්ගලයන් අල්ලාගෙන රඳවා ගනු ලැබ සිටින ස්ථානයන්හි කටයුතු කිරීමටද, තම නියෝජිතයෝ ලොව පුරා යවයි. අල්ලා ගනු ලැබ අඩස්සියෙහි රඳවුණු පුද්ගලයනට සපයා ඇති ඉඳුම් හිටුම්ද , ඔවුන් ලබන සැලකිලි හා ආහාරද පරීක්ෂා කරන කමිටුවේ නියෝජිතයෝ, ඒවායෙහි තත්ත්වයන්හි අවශ්‍ය වර්ධනයන් ලබා ගැනීම පිණිස, උචිත ස්ථානයන්හිදී අදාළ බලධර පක්ෂය වෙතද යන්නෝය.

ජා.ර.කු. කමිටුව, සතුරු රටවල හෝ යටත් ප්‍රදේශවල හෝ සිටින සිවිල් ජනතාවන් වෙනුවෙන්ද ක්‍රියා කරන්නේය. ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුම් සිද්ධීන්හිදී කමිටුව සිය කටයුතු ඉටු කරන්නේ මධ්‍යස්ථ මැදිහත්වන්නකු වශයෙනි.

එම කාර්යභාරය එයට පවරා තිබෙන්නේ 1949 ජිනිවා ගිවිසුම් සතරටම පොදු 3 වන වගන්තියෙනි. ජා.ර.කු. කමිටුවේ වැදගත් තවත් කටයුත්තක් නම් , ආගිය අතක් නැති පුද්ගලයන් සෙවීම සහ සන්නද්ධ ගැටුම් විසින් එකිනෙකාගෙන් වෙන් කැරුණු පුද්ගලයන් අතර ඔවුන්ගේ පවුල්වල පණිවුඩ හුවමාරු කිරීමය. ජා.ර.කු. කමිටුවේ, මධ්‍යම ගවේෂණ ආයතනයේ ( එම ආයතනයේ ප්‍රධාන කාර්යාලයද පිහිටා තිබෙන්නේ ජිනිවා නුවරය. ) ලිපි ගොනු තුළ, වසර 100 පමණ කාලයෙකදී එකතුවී ඇති කාඩ්පත් සංඛ්‍යාව කෝටි පනස් පහකි. ඒවායින් නියෝජනය වන තනි තනි සිද්ධීන් සංඛ්‍යාව දැන් කෝටියෙකි.

අවසාන වශයෙන් යුද්ධ නිසා සාගින්නෙන් පෙළෙන සිවිල් ජනතාවට සහන සපයන ලෙසද ජා. ර. කු. කමිටුවෙන් ඉල්ලා සිටීමට පුළුවන. කටුකම්බි වැටවල් හා යුද වැටලීම් තරණය කිරීමටද අල්ලාගෙන ඇති ප්‍රදේශයන්හි නිදහසේ සැරීමටද හැකියාව ඇති එකම සංවිධානය බොහෝ විට ජා. ර. කු. කමිටුව නිසා, ජීවිතයකට ආහාර, ඇඳුම් හා බෙහෙත් සැපැයීමට එයට හැකිය.

මෙම සියලු ක්ෂේත්‍රයන්හිදී ජා. ර. කු. කමිටුව, ඒ, ඒ, පුද්ගලයන්ගේ ජාතිය, වර්ණය සමාජ තරාතිරම හෝ දේශපාලන අදහස් උදහස් හෝ නොසලකා ඔවුන්ගේ අවශ්‍යතා අනුව උපකාර කරයි. ආගමික, දේශපාලන හෝ ජනවාර්ගික හෝ වාදභේදාදියට සහභාගීවීම, එයට තම දූත මෙහෙවර විසින්ම තහනම් කරනු ලැබ තිබේ.

## ජා. ර. කු. කමිටුවේ කටයුතුවල විශ්වාසනීය භාවය.

මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් ප්‍රසිද්ධියේ අනාවරණය කිරීමක් ජා. ර. කු. කමිටුවෙන් නොසිදුවේ. තමනට පැමිණීමට අවසර දෙන රටවල්වලදී තමන් සොයා ගත්තා කරුණු ගැන, කමිටුව වාර්තා ප්‍රකාශයට පත් නොකරයි. කමිටුවේ අරමුණ, ගැටුමෙකින් විපතට පත්වන පුද්ගලයනට ප්‍රායෝගික සහන සැපැයීමයි. එය සිය සම්ප්‍රදායික කටයුතු කරන්නේ නුවණින් විමසා බලා දේශපාලන වාදභේද මගහරිමින් අතිශයින්ම නිපුණ දක්ෂ ආකාරයකටය. කමිටුව වාර්තා කරන්නේ අදාළ ආණ්ඩුවට පමණි. එසේ කිරීමෙන් සහ තම සොයා ගැනීම් ප්‍රසිද්ධ කිරීමෙන් " ප්‍රසිද්ධිකිරීම නොකැමෙන් " සිරකරුවන් ආදීන්ගේ තත්ත්වයන් දියුණු කරන සේ ආණ්ඩුවලට වඩාත් හොඳින් බලපෑම් කිරීමට තමනට හැකියැයි කමිටුව හඟියි. ජා. ර. කු. කමිටුව මෙම නීතියෙන් බැහැර වන්නේ, මානව අයිතිවාසිකම් විශාල වශයෙන් පිට පිටම උල්ලංඝනය කිරීමේ දුලබ අවස්ථාවන්හිදී පමණි.

## අභ්‍යන්තරික ගැටුම් පවතින අවස්ථාවනට යොදා ගැනීමේ හැකියාව

සහෝදර ඝාතක වෛරය ඇතැවීම නිසාම සමහරවිට ජාත්‍යන්තර යුද්ධවලට වඩා රුදුරු අභ්‍යන්තරික ගැටුම්වලින් විපතට පත්වන අයට ආධාර කිරීමට රතුකුරුස කමිටුව දීර්ඝ කාලයක සිට උත්සහ දරනු ලැබේ. ‡

---

‡ සිව්වන ජිනීවා ගිවිසුමට අර්ථ නිරූපනය, සංස්කාරක ජීන් පික්ටෙට් ජිනීවා ජා. ර. කු. කමිටුව 1958

ශ්‍රී ලංකාවට පැමිණෙන ලෙස ජා.ර.කු. කමිටුවට ආරාධනා කළයුතු බවට ඉදිරිපත්වූ අදහස් ප්‍රතික්ෂේප කරනු ලැබීමට එක් හේතුවක් වූයේ ජිනීවා ගිවිසුම් අදාළ වන්නේ ජාත්‍යන්තර යුද ගැටුම් අවස්ථාවනට පමණෙකැයි යන වැරදි විශ්වාසයයි.

කෙසේ වෙතත්, ජිනීවා ගිවිසුම්වලට අත්සන් තැබූ පාර්ශවයක් වන රටක් ඇතුළත සිදුවන ජාත්‍යන්තර ස්වරූපයේ නොවන සන්නද්ධ ගැටුම්වලට ද ගිවිසුම් අදාළ බව එම ගිවිසුම් වල පොදු 3 වන වගන්තිය පැහැදිලිවම සඳහන් කරයි. එම වගන්තිය, එක්මත් කන්වෙන්ෂ තුළ අතිශයින් ම වැදගත්ය. ජිනීවා ගිවිසුම්වලට අත්සන් තබා ඇති පාර්ශවයක් වශයෙන් ශ්‍රී ලංකාව ද එම වගන්තිය අනුව වගකීමට බැඳී සිටී. අභ්‍යන්තරික සන්නද්ධ ගැටුමෙහි විපතට පත්වන පුද්ගලයන් සම්බන්ධයෙන්, අවමයක් වශයෙන් යම් විධි විධානයක් පිළිපැදිය යුතු බව පොදු 3 වන වගන්තියෙන් විධානය කරනු ලැබ තිබේ. ජිනීවා ගිවිසුම්වල අනෙක් කොටස් ද ක්‍රියාත්මක කරන ලෙස එය, ගැටුමෙහි පාර්ශවයන්ගෙන් තරයේම ඉල්ලා සිටී. "ජාත්‍යන්තර රතුකුරුස කමිටුව වැනි, අපක්ෂපාත මානුෂික සංවිධානයක්, ගැටුමෙහි පාර්ශ්වයනට තම සේවාවන් පිරිනමනු ඇත" යනුවෙන් ද එහි සඳහන් වේ. "මූලිකත්වය ගැනීමේ අයිතිය" නමින් හැඳින් වෙන මෙම අයිතිය ජා.ර.කු. කමිටුව විසින් අවුරුදු බොහෝ ගණනාවක් තිස්සේ ක්‍රියාත්මක කරනු ලැබ තිබේ. එමෙන්ම බොහෝ ආණ්ඩු ද දිරි දැනැවෙන අයුරින් එයට ප්‍රතිචාර දක්වා තිබේ. ඒ අතින් වැදගත් නිදර්ශන කීපයක් පසුව සඳහන් කරමු.

අභ්‍යන්තරික සන්නද්ධ ගැටුම් තත්ත්වයනට අදාළ වඩාත් සවිස්තර විධිවිධාන 1977 අමතර ගිවිසුම් දෙකෙහිම අන්තර්ගත කරනු ලැබ තිබේ. එහෙත් ඉක් එතකට වත් ශ්‍රී ලංකාව තවමත් අත්සන් තබා නැත. ඒවාට අත්සන් තබන ලෙස ශ්‍රී ලංකාවට බල කළ යුතුය. එහෙත් එය වෙනම කාරණයකි.

### සන්නද්ධ කණ්ඩායම්ද මානුෂික ප්‍රමිතීන් රැකීමට බැඳී සිටිති.

තුන්වන වගන්තියෙන් බැඳෙනුයේ නිත්‍යානුකූල ආණ්ඩු පමණක් නොවන බව පැහැදිලිය. " ගැටුමේ සෑම පාර්ශවයක්ම, පිළිපැදීමට බැඳී සිටී " යන වාක්‍ය ඛණ්ඩයෙහි තේරුම නම්, ගිවිසුම්හි අඩංගු අවම මානුෂික මූලධර්මවලට ගරු කිරීමට සන්නද්ධ විපක්ෂ කණ්ඩායම්ද, එසේ බැඳී සිටීමයි. මෙය ඓතිහාසික ජයග්‍රහණයෙකි. ජිනීවා සම්මුතිවල පොදු ආර්ථ නිරූපනයෙහි ඒ ගැන මෙසේ සඳහන් වේ.

UNIVERSITY OF SRI LANKA LIBRARY

" සෑම පාර්ශවයක්ම " යන වචන වලින් සනිටුහන් කරනුයේ අවුරුදු කීපයෙක ඇවෑමෙන් ජාත්‍යන්තර නීතියෙහි සිදුව ඇති විශාල ප්‍රගතියයි. ගිවිසුමකට අත්සන් නොතැබූ පාර්ශවයක්, විශේෂයෙන්ම ගිවිසුම අත්සන් තබන අවස්ථාවේ නොපැවැති පමණක් නොව, ජාත්‍යන්තර වගකීම් බාර ගැනීමට හැකියාව ඇති නිත්‍යානුකූල ජීවමාන පැවැත්මක් නියෝජනය කිරීමේ අවශ්‍යතාවක් පවා නැති පාර්ශවයක්, ජාත්‍යන්තර ගිවිසුමක් මඟින් බැඳීමකට ලක් කිරීමට නීතිය අනුව නොහැකියැයි මේ මෑතක් වනතුරුම සලකන්නට ඇත.

* * *

කැරලිකාර පාර්ශවයක් 3 වන වගන්තිය පිළිපදිනවා නම්, ගැටුමෙන් විපතට පත් වන පුද්ගලයනට යහපතක්ම වන්නේය. එවිට කිසිවකු මැසිවිලි නොකියනු ඇත. කැරලිකාර පක්ෂය එය නොපිළිපදිනවා නම්, ඔවුන්ගේ ක්‍රියා තේරුමක් නැති අරාජිකවාදී ක්‍රියා ලෙසින් හෝ මංකොල්ලකාරී ක්‍රියා ලෙසින් හෝ සලකන අය නිවැරදි බව එයින් සනාථ වනු ඇත.

- ජීන් පික්ටෙට්

3 වන වගන්තියේ මෙම පැත්ත බොහෝවිට නොසලකා හරිනු ලැබේ. එහෙත් " කැරලිකාර පාර්ශවයන් " මූලික මානුෂික ප්‍රමිතීන් නොසලකා හරින රටවල්වලට එය තීරණාත්මක ලෙසින්ම වැදගත්ය. එවැනි රටවල් බෝහෝ තිබේ. ඇතැම්, සන්නද්ධ විපක්ෂ කණ්ඩායම් එවැනි ප්‍රමිතීන් පිළිගෙන තිබෙන බවත්, ඔවුන් ජා.ර.කු. කමිටුවට සහයෝගය දක්වා ඇති බවත් ජා.ර.කු. කමිටුවේ වාර්ෂික වාර්තාවලින් පැහැදිලිවේ. අංක 3 උප ලේඛනයෙහි, එල් සැල්වදෝරය, නිකරගුවා සහ උගන්ඩාව සම්බන්ධයෙන් වන සඳහන් නිදසුන් ලෙසින් බලන්න.

## විරෝධ කණ්ඩායම්වලට නිත්‍යානුකූල තත්ත්වයක් අයිති නොවේ.

කෙසේවෙතත් ජා.ර.කු. කමිටුව මෙහි නොකැඳවීමට ප්‍රධාන හේතුව වශයෙන් පෙනෙන්නට තිබෙන්නේ, එයින් එල්ටීටීඊ සංවිධානයට ( හෝ බෙදුම්වාදී සන්නද්ධ අනෙක් කවර සංවිධානයකට හෝ) යම් ප්‍රමාණයක ජාත්‍යන්තර පිළිගැනීමක්

හිමිවනු ඇතැයි හෝ ඔවුනට කිසියම් තත්ත්වයක් එමගින් ලැබෙනු ඇතැයි හෝ යන හැඟීමය. එවැනි බිය මුළුමනින්ම පදනම් රහිතය. පීනිවා ගිවිසුම්වල අදාළ විධානය විශේෂයෙන්ම සකස් කැර තිබෙන්නේ ආණ්ඩු පැත්තෙන් ඇතිවිය හැකි එවැනි සැක නැති කිරීම සඳහාය. මේ අතින්, පොදු 3 වන වගන්තියේ අන්තිම වාක්‍යය අනෙක් සියල්ලටම වඩා වැදගත්ය. එය මෙසේය.

" ඉහතින් දැක්වුණු විධි විධාන ක්‍රියාත්මක කිරීම, ගැටුමේ පාර්ශ්වයන්ගේ නීතිමය තත්ත්වයනට බලනොපානු ඇත. "

මතු කැරතිබෙන සැකවලට සම්පූර්ණ පිළිතුර මෙයයි.

පික්ටෙට් ගේ අර්ථ නිරූපනය, මෙම විධානය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන නිරීක්ෂණ මෙසේය.

## 4 වන පරිච්ඡේදය - ගැටුමේ පාර්ශවයන්ගේ නීතිමය තත්ත්වයන් මත බලපෑමක් නැත.

මෙම වගන්ති ඛණ්ඩය අත්‍යවශ්‍යය. එය නොමැතිව, 3 වන වගන්තිය හෝ ඒ වෙනුවට වෙනත් වගන්තියක් හෝ කවරදාවත්, සම්මත නොකරන්නට තිබිණි. සිවිල් යුද්ධයෙකදී, ඉතාම සීමිත ප්‍රමාණයකට හෝ ගිවිසුම ක්‍රියාත්මක කිරීම, නීත්‍යානුකූල ආණ්ඩුව, නීත්‍යානුකූලව කැරැල්ලක් මැඩීමට ඇඟිලි ගැසීමක් වනු ඇතැයි හෝ, එසේ නැති නම්, විරුද්ධ පාර්ශවයට යුද වැදුණු පාර්ශ්වයෙක තත්ත්වය ප්‍රධානය කිරීමක් සිදුවී, ඒ අනුව එම පාර්ශ්වයේ නීතිමය බලය හා ශක්තිය වර්ධනය වනු ඇතැයි හෝ යනුවෙන් පවතින ( සැම කල්හිම එකම ) බියට එය පිළිතුරෙකි.

ගිවිසුමේ අරමුණු තනිකරම මානුෂික එකක් බවත්, එය රාජ්‍යයන්හි අභ්‍යන්තරික කටයුතු සම්බන්ධයෙන් කිසිම ආකාරයක උනන්දුවක් නොදක්වන බවත්, එයින් අපේක්ෂා කරන්නේ , සැම තැනකටම, සැම තත්ත්වයන් යටතේම වලංගුවූ ද, කුඩු යුද්ධයට වඩා උත්කෘෂ්ටවූ හා බාහිරවූද, ලෙසින් ශිෂ්ඨාචාර සියලු ජාතීන් විසින් සලකනු ලබන, මිනිස් වර්ගයාගේ අත්‍යාවශ්‍ය නීති කීපයකට ගෞරව කිරීම සහතික කිරීමට බවත් මෙයින් මුළුමනින්ම පැහැදිලි කැරේ.

ඒ අනුව 3 වන වගන්තිය ක්‍රියාත්මක කිරීමම, නීත්‍යානුකූල ආණ්ඩුවක් විසින් විරුද්ධ,

OPEN UNIVERSITY OF SRI LANKA
LIBRARY



පාර්ශවය කිසිම ආකාරයෙකින් පිළිගනු ලැබීමක් නොවනු ඇති අතර තමන්ගේම නීතිරීති වලින් වර ලැබෙන අවිද ඇතුළුව ඕනෑම මාධ්‍යයෙකින් කැරැල්ලක් මැඩීමට ආණ්ඩුව සතු අයිතිය කිසිම ආකාරයෙකින් සීමා කිරීමක්ද එයින් නොසිදුවේ. තමන්ගේම නීති අනුව විරුද්ධවාදීන් නීතිය හමුවට පැමිණවීමට, නඩු විභාග කැරවීමට හා ඔවුන්ගේ අපරාධවලට දඬුවම් දෙවීමට ආණ්ඩුවට ඇති අයිතියටද එයින් කිසිම බලපෑමක් නොසිදුවේ.

එලෙසම විරුද්ධ පාර්ශවය කුමක් වුවත්, කුමන කරාතිරම් නාමයෙකින් තමන් හඳුන්වා ගනු ලැබුවත්, 3 වන වගන්තිය ක්‍රියාත්මක කිරීමෙන් ඔවුනට විශේෂ ආරක්ෂාවක් හෝ දඬුවම් නොලැබ නීති කඩ කිරීමේ කිසිම වරප්‍රසාදයක් හෝ හිමි නොවේ.

ගිවිසුමෙහි අනෙක් කොටස්ද උනන්දුවන්නේ එක්, එක් පුද්ගලයා ගැනත්, එම පුද්ගලයන්ගේ අනෙක් ගුණාංග මොනවා වුවත් හුදු මනුෂ්‍යයකු වශයෙන් ඔහුට හිමි නායික සැලැකිලි ගැනත් පමණක් බව, 3 වන වගන්තිය පිළිබිඹු කරයි. ඔහුගේ ක්‍රියා කලාපය අනුව ඔහු ලබනු ඇති නීතිමය හෝ දේශපාලන හෝ සැලැකිලිවලට එය බලපාන්නේ නැත.

**" අභ්‍යන්තර " තත්ත්වයන් තුළ ජා.ර.කු. කමිටුව ක්‍රියා කරන සැටි - නිදසුන් කිපයක්**

ඇත්ත වශයෙන්ම, ජිනීවා ගිවිසුම්වල මෙම අංශය, බොහෝ වරටවල් විසින් කොපමණ හොඳින් තේරුම් ගෙන තිබේදැයි ජා.ර.කු. කමිටුව 1969 තරම් ඈතදී කළ අධ්‍යයනයකින් හෙළිවී ඇත. එයින් පෙන්වා දෙන පරිදි ඊට කලින් 11 වසර තුළ ආණ්ඩු 42 ක්, අඩස්සියෙහි පසුවන ලක්ෂයකට ආසන්න පුද්ගලයන් හමුවීමට ජා.ර.කු. කමිටුවට අවසරදී තිබේ. ඔවුන් රඳවා ගෙන සිට තිබුණේ නියම අරුතින්ම කතා කරනවානම්, " සන්නද්ධ ගැටුම් " ගණයට පවා නොගැණෙන අභ්‍යන්තරික තත්ත්වයන්ගේ ප්‍රතිඵල වශයෙනි. ඊට වඩා මෑත , එනම්, 1985 දී ජා.ර.කු. කමිටුව 80 ට අධික රටවල්වල ක්‍රියාත්මක ලෙසම නිරතව සිටියේය. එහිදී කමිටුව කළ කටයුතු අතර, යුද සිරකරුවන් සහ ඊනියා " ආරක්ෂක හේතූන් මත රඳවා ගැනුණු" පුද්ගලයන් තිස් දහසක් මුණ ගැසීම ද හැකිවූ පුද්ගලයන්

සොයා දෙන ලෙසින් කැරුණු ඉල්ලීම් 27,506 ක පමණ සකස් සිදුවද ගවී.
( එයින් 7949 දෙනකුට අත්වැ තිබුණු ඉරණම සොයා ගනු ලැබීය. )

තමන්ගේ ගැටුම් තනිකරම අභ්‍යන්තරික ඒවා ලෙස සලකන රටවල් බොහෝ සංඛ්‍යාවෙකද සිය කටයුතු ඉටු කිරීමට 1986 වර්ෂයේදීම ජා.ර.කු. කමිටුවට අවසර ලැබුණේය. සන්නද්ධ ගැටුම් නොවන " අභ්‍යන්තරික කලබලකාරී හා උණුසුම් " තත්ත්වයන් ඒවාට ඇතුළත්ය. එවැනි රටවල් අතර චිලිය, එල්සැල්වදෝරය, (ඩුවෙලියර් පාලනය ) හයිටිය, මොසැම්බික්, නිකරගුවා, පීරු ( මාකෝස් යටතේ ) පිලිපීනය, දකුණු අප්‍රිකාව, ( බාස්ක් බෙදුම්වාදීන් සම්බන්ධයෙන් ) ස්පාඤ්ඤය, උගන්ඩාව සහ සැයරය ද විය. අනෙක් සෑම රටකදීම " රඳවා ගැනුණු පුද්ගලයනට ආරක්ෂාව සැලැසීමට " ( එනම් ඔවුන් මුණ ගැසීමට ) ජා.ර.කු. කමිටුවට අවසර ලැබුණු අතර, අවම වශයෙන් එයින් අඩෙකදීවත් කමිටුව, නැතිවූ පුද්ගලයන් සෙවීමේ නිරතවූයේය. එයින් සමහර ආණ්ඩු සැලැකෙන්නේ ඇප ආණ්ඩුව තරම් ප්‍රජාතන්ත්‍රවාදී හෝ මානුෂික නොවන ආණ්ඩු ලෙසිනි. අනෙක් අතට, සිවිල් ගැටුම්වල අවශ්‍යතාවනට මුහුණදීමට අපට වඩා හැකියාවක්ද එම රටවලට තිබේ. එහෙත් ඔවුන් සියල්ලම, ජිනීවා ගිවිසුම්වල හරය සමග එකඟ වෙමින්, ජීවකීය මානුෂික කටයුතු කැර ගෙන යාමට ජා.ර.කු. කමිටුවට අවසරදී තිබේ.

ඊශ්‍රායලය තුළ සහ අල්ලාගනු ලැබූ ප්‍රදේශවල ජා.ර.කු.කමිටුව දිගටම කැරගෙන යන කටයුතු උනන්දුව දනවන සුළුය. එහිදී කමිටුවේ කටයුතු ප්‍රධාන වශයෙන් පදනම් වන්නේ සිවිල් පුද්ගලයන්ගේ ආරක්ෂාවට අදාළ සිවු වැනි ජිනීවා ගිවිසුම මතය. සිවු වැනි ගිවිසුම ක්‍රියාත්මක නොකළ හැකි යැයි ඊශ්‍රායල් බලධාරීන් කියා සිටියද , එහි සමහර විධි විධාන වලට ඇත්ත වශයෙන්ම එකඟවීමට ඔහු අපේක්ෂා කරති. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 1986 වර්ෂය තුළ ආරක්ෂාව සැපැයීමේ කටයුතු රාශියක් කිරීමට ජා.ර.කු. කමිටුවට හැකිවිය. නඩු විභාග බලාපොරොත්තුවෙන් අත්අඩංගුවෙහි පසුවන හා වැරදි කරුවන් කරනු ලැබ බන්ධනාගාරවල සිටින පුද්ගලයන් 4000 ක් මුණ ගැසීමද, ප්‍රශ්න කිරීම සඳහා රඳවා ගනු ලැබ සිටින පුද්ගලයන් 1405 දෙනකු සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීමද, එම කටයුතුවලට ඇතුළත්ය . අඩස්සිගත පුද්ගලයන්ගේ පවුල්වලටද ආධාර කළ කමිටුව, අඩස්සියෙහි පසුවන තම ඥාතීන් මුණ ගැසීමට ඔවුනටද අවස්ථාව ලබා දුන්නේය.

මෙම රටවල්තුළ ජා.ර.කු. කමිටුව ඉටුකරන කටයුතුවල සමහර වැදගත් තොරතුරු 3 වන උප ලේඛනයෙහි ඇත. තුවාල කරුවනට ඵලදායක වෛද්‍ය ආධාර ද යුද්ධය නිසා අබලයන් වන පුද්ගලයනට දිර්ඝ කාලීනව ආධාරදැසැපැයීම අතින් ජා.ර.කු. කමිටුවේ කටයුතුවල ආදර්ශ තත්වන ලෝකයේ අපේ රට වැනි රටකට විශේෂයෙන්ම අදාළය.

ජීවිතා ගිවිසුම්වල වැදගත්කම, වටිනාකම සහ ප්‍රායෝගික බව නියම ආකාරයෙන් වටහා ගැනීමට නම්, ජාත්‍යන්තර මානුෂික නීතිය පුළුල් ලෙස පතුරුවාලීම අත්‍යාවශ්‍යය. එය සපුරා ගැනීම පිණිස දැරෙන අඛණ්ඩ ප්‍රයත්න ජා.ර.කු. කමිටුවේ වාර්ෂික වාර්තා වලින් පිළිබිඹුවේ.

## <u>ශ්‍රී ලංකාවේ පවතින තත්වයට ජා.ර.කු. කමිටුවේ ඇති අදාළකම.</u>

ශ්‍රී ලංකාවේ අප අද මුණ පා සිටින ශෝචනීය තත්වයට ජා.ර.කු. කමිටුවේ කටයුතුවල ඇති අදාළකම අවධාරණය කිරීම අවශ්‍ය නැති තරම්ය. එය, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව ඒකමතික චන්දයෙකින් පිළිගනු ලැබූ අදාළකමෙකි. ශ්‍රී ලංකාවේ වර්තමාන ගැටුම් බරපතල පරිමාණයකට වර්ධනයවී ඇති බව ප්‍රචලිත ලෙස පැළිගැනුනෙකි. රටේ ජනතාවගෙන් විශාල කොටස් එයට ගොදුරු වී තිබේ. සටන් වැදුණු අය මෙන්ම සිවිල් ජනතාවද දහස් ගණනින් විනාශයට පත්වී ඇත. ගේ දොර අහිමිව අනාථවූ සංඛ්‍යාවද බොහෝය. රටේ අනෙක් සියල්ල යටපත් කරන ප්‍රධානම කටයුත්ත බවට පත්වී ඇති එය, රටේ මිනිස් සම්පත මෙන්ම ද්‍රව්‍යමය සම්පත්ද කාබාසිනියා කරන්නේය.

යාපනය දිස්ත්‍රික්කයේද උතුරු හා නැගෙනහිර පලාත්වල අනෙක් ප්‍රදේශයන්හිද සිවිල් ජනතාව, දැනට වසර ගණනාවක සිට ආරක්ෂක හමුදාවලත්, සන්නද්ධ බෙදුම්වාදී කණ්ඩායම්වලත්, වෙඩි හුවමාරුවට මැදිවී සිටිති. සිවිල් පුද්ගලයන් බොහෝ දෙනකු මරුමුවට පත්ව ඇත. බොහෝ දෙනකුට තුවාල සිදුවී ඇත. බොහෝ දෙනකුට ගේ දොර සහ ජීවනෝපාය මාර්ගද අහිමිවී ඇත. දහස් ගණනක් අතරමංව අනාථ කඳවුරුවල සිටිති. අත්‍යාවශ්‍ය සැපැයීම් සහ සෞඛ්‍ය සහ වෛද්‍ය සේවාවන් ඇතුළු සේවාවන් ඇනැහිට ඇත. සිවිල් ජනතාවට සිදුවන

විපත්වලට මෙන්ම සටන් වැද නි... වන පුද්ගලයනටද , පුහුණු සෞඛ්‍ය වෛද්‍ය ආධාර අත්‍යාවශ්‍ය ...වලවූවනටද උපකාර සහ වෛද්‍යාධාර අත්‍යාවශ්‍යය. දහස් ගණන් සැකකරුවෝ ... කඳවුරු තුළ සහ සිර කඳවුරුතුළ රඳවා ගනු ලැබ සිටිති. ඒ අතර ...දවුම් ස්ථානයන්හි පවතින සෞඛ්‍යයට අහිතකරවූත් අසතුටුදායක වූත් තත්ත්වයන් ගැනද, රඳවා ගනු ලැබූවනට කරන නින්දිත පහත් සැලකිලි ගැන හා ... තබා වධදීම් ගැනද වාර්තා ගලා එම සාමාන්‍ය දෙයක් බවට පත්වී තිබේ. දේශපාලන වැරදිවලට, වැරදිකරුවන්ව සහ නඩු විභාග බලාපොරොත්තුවෙන් තවත් බොහෝ දෙනෙකු බන්ධනාගාර තුළ සිටින අතර ඔවුන් රඳවා ගනු ලැබ සිටින තත්වයන්ද සංවේගයට කාරණයෙකි. මිනිසුන් විශාල සංඛ්‍යාවක් නැතිවී ඇති බවට හා " අතුරුදහන් " වී ඇති බවට වාර්තා වී තිබේ. පීඩාවට පත්ව සිටින බහුතර ජනතාව, වැඩිපුරම රටේ උතුරු හා නැගෙනහිර පළාත්වල ජීවත්වන දෙමළ ජනවර්ගයට අයත් වූවන් වන අතර, ප්‍රධාන කොළඹ නගරයේම සහ පිට පළාත්වල සිංහල හා මුස්ලිම් ඇතුලු අනෙක් ජන වර්ගවල සිවිල් ජනතාව කැරලිකාරයන්ගේ ප්‍රහාරවලට ලක්වී සිටිති. ඔවුන් බොහෝ දෙනකු මරුමුවට පත්ව ඇත. තුවාල ලැබුවෝද බොහෝය. ජීවනෝපාය මාර්ග අහිමිවූවෝද, අතරමංවූවෝද බොහෝය.

ගැටුමේ ස්වභාවය සහ මට්ටමද , සෑම පාර්ශවයක්ම විඳවන දුක් වේදනාද, මානුෂික මූලික්ත්වය ගැනමේ හා ආධාර අවශ්‍යතාවේ බරපතලකම ද, ජාත්‍යන්තර චරියාවේ නීතිවලට අනුකූල ආධාර පිරි[...]නැමීම සලකා බැලීමට ආණ්ඩුවට බල කෙරෙන හේතු සාධකවේ. එම තත්ත්වය යටතේ සහය වන ලෙස ඇරියුම් කිරීමට ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට වඩා සුදුසු වෙනත් නියෝජිත ආයතනයක් නැත. ගැටුමෙහි සියලු පාර්ශවයන් ගිවිසුම්පිළිපැදීමට සැලැස්වීමද, එයට දී ඇති වරමට ඇතුළත් බව මෙහිදී සිහිපත් කළ යුතුය. එබැවින්, ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නියෝජිතයන් මෙහි සිටීම, බෙදුම්වාදී අපරාධ, විශේෂයෙන්ම, ජිනීවා ගිවිසුම්වල මානුෂික ප්‍රතිපත්තිවලින් පිළිකුල් කරනු ලබන ක්‍රියා කලාපයක් වන, අසරණ සිවිල් වැසියනට පහර දීමේ අපරාධවලට, තිරිංග දැමීමක් ද වනු ඇත. කමිටුව මෙහි ක්‍රියාත්මකවීම, ගැටුමේ ප්‍රතිඵල වශයෙන් ශ්‍රී ලංකාවේ දුක් වේදනා විඳින දහස් සංඛ්‍යාත පුද්ගලයනට සැහෙන සැනසිමක්ද සහන සහ ආධාරද ලැබීමට හේතුවෙනවා පමණක් නොව, සෑම ජාතියකටම අයත් ස්වකීය පුරවැසියන් ආරක්ෂා කිරීමට හා ඔවුන්ට ආධාර කිරීමට ආණ්ඩුව තුළ තිබෙන අවංක අධ්‍යාශය ද එයින් කහවුරු වන්නේය.

OPEN UNIVERSITY OF SRI LANKA LIBRARY

ජානෙල් පොන්සේකා

සූරියා වික්‍රමසිංහ

ක්‍රියා කාරී කමිටුව වෙත ඉදිරිපත් කැරුණු වාර්තාවෙකි.

ප්‍ර.අ.ආ. පෙරමුණේ ක්‍රියාකාරී කමිටුව විසින් සම්මත කොට, මෙයට යාකොට ඇති පුවත් පත් සඳහා වන 1987 ජුලි 17 දාතමින් යුත් ප්‍රකාශය සමඟ ප්‍රසිද්ධියට පත් කිරීම සඳහා නිකුත් කැරිණි.

<u>පසුවදන</u>

ශ්‍රී ලංකාවෙහි සාමය හා නීතිය ස්ථාපිත කරනු පිණිස 1987 ජුලි 29 වන දා ඉන්දු-ශ්‍රී ලංකා ගිවිසුම අත්සන් කරනු ලැබීය. ජනවාර්ගික ප්‍රශ්නය දේශපාලන වශයෙන් විසැඳීමේ හා එමඟින් සාමය උදාකිරීමට ඇති ඉඩකඩ ගැන සිය සතුට පළ කරමින් ප්‍රකාශයක් නිකුත් කළ ප්‍ර.අ.ආ.පෙරමුණ එහි මෙසේ ද සඳහන් කෙළේය."දහස් ගණනින් මිනිසුන් මරා දැමීමට ද, සමූහ වශයෙන් "අතුරුදහන්" වීමට ද හේතු වූ මෙන්ම, මිනිසුනට දැඩි දුක් වේදනා සහ හිංසාපීඩා ගෙනැදීමට ද හේතු වූ සිවිල් කලහකාරී යුගයෙක අවසානය ගිවිසුමෙන් සටහන් කරන්නේය. එය, සාමයේ සහ එක්සත්භාවයේ නව යුගයෙක ආරම්භය ද සටහන් කරනු ඇතැයි අප බලාපොරොත්තු වෙමු.

ගැටුමේ දායාදය වශයෙන් උරුමව තිබෙන තත්ත්වයට පිළියම් යෙදීමේදී ජා.ර.කු. කමිටුවේ සහාය තවදුරටත් ලබා ගැනීමේ උචිතකම ගැන ප්‍ර.අ.ආ. පෙරමුණ මෙසේ කියා සිටියේය.

"ඉදිරියේදී ඉටුකළ යුතුව තිබෙන කාර්යයනට විරුද්ධව බොහෝ අභියෝගද බොහෝ බාධකද තිබේ. ඒවා ඉබේම මගහැර යනු ඇතැයි තෘප්තිමත්ව නොසිටිය යුතුය. ගිවිසුමේ නිශ්චිත විධි විධාන වලට අමතරව උතුරු සහ නැගෙනහිර පලාත් පුනුරුත්ථාපනය කිරීමේ කාර්යය ද හදිසි කටයුත්තක් ලෙසින් සලකා ආණ්ඩුව විසින් සපුරා ලිය යුතුය. "අතුරුදහන්වූ"පුද්ගලයනට අත්වී ඇති ඉරණම කිමෙක්දැයි තිර වශයෙන් දැනගැනීම වැනි දැවෙන මානුෂික ප්‍රශ්නද විසැඳිය යුතුව තිබේ.

යි
එම කාර්යයෙලා පුනුරුත්ථාපන කටයුතු සඳහා විශේෂඥ සහයද අවශ්‍යය. යළි ගොඩ-
-නැගීමේ සහ පුනුරුත්ථාපනය කිරීමේ කටයුතු සම්බන්ධයෙන්ද, උන්හිටිතැන් අහිමිවූ සහ
අතුරුදන්වූ පුද්ගලයන් සම්බන්ධයෙන් මෙන්ම නැතිවූ පුද්ගලයන් සොයා ගැනීම සම්බන්ධයෙන්ද,
තුවාලවූ සහ ආශ්‍රිත පුද්ගලයනට ආධාර කිරීම සම්බන්ධයෙන් ද දීර්ඝ අත්දැකීම් සහ
විශේෂ පුහුණුවක් ඇති ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ ආධාර පිළිගන්නා ලෙස ප්‍ර.අ.ආ.
පෙරමුණ ආණ්ඩුවට යළි ආයාචනා කරයි. මෙම ක්ෂේත්‍රයෙහි විශේෂ නිපුනත්වයක් දරන
තවත් නියෝජිත ආයතනයක් නම් අනාථයන් සඳහා වන එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්
කාර්යාලයයි. ( යූ.එන්.එච්.සී.ආර්.) පවතින තත්ත්වයන් විසින් බලකරනු ලැබූ
අතුරුදහන්වූ සහ ස්ව කැමැත්තෙන් තොරව අතුරුදහන්වූ පුද්ගලයන් සම්බන්ධයෙන් වන
එක්සත්ජාතීන්ගේ ක්‍රියාකාරී කමිටුවටද ශ්‍රී ලංකාවට පැමිණෙන ලෙස ඇරියුම් කරන්නයැයි
ප්‍ර. අ.ආ. පෙරමුණ ආණ්ඩුවෙන් ඉල්ලා සිටී."

ඉන් පසු, එනම් 1987 ඔක්තෝබර 20දා "සාම ගිවිසුමෙන් පසු දිවයින පුරා ප්‍රචණ්ඩ ක්‍රියා" මැයෙන් ප්‍රකාශයක් නිකුත් කළ ප්‍ර.අ.ආ.පෙරමුණ එමගින් මෙසේද කියා සිටියේය.

" <u>හදිසි ආයාචනයක්</u>

අවසාන වශයෙන්, ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ විශේෂඥ සේවාවන් බාර ගන්නා ලෙස කරන ආයාචනය ආණ්ඩුව වෙත යළිත් ඉදිරිපත් කිරීමට ප්‍ර.අ.ආ.පෙරමුණ අදහස් කරයි. එය වහාම ඉටුවිය යුතු කාරණයක් බැවිනි. එම කමිටුවේ විශේෂඥ පලපුරුද්ද රටේ දකුණු කොටසට මෙන්ම, උතුරු හා නැගෙනහිර පළාත්වලටද අතිශයින්ම අදාළ සහ ප්‍රයෝජනවත් වනු ඇත.

ශ්‍රී ලංකාවේ තත්වයට පිහිටා සුළුමුතිය සහ ජා.ර.කු.කමිටුව අදාළ වන සැටි පිළිබඳව සවිස්තර වාර්තාවක් ප්‍ර.අ.ආ පෙරමුණ සාම ගිවිසුමට පෙර ටික කලකට ඉහත දී ප්‍රකාශයට පත් කෙළේය. එයඅද අවශ්‍යතාවන්ටද එලෙසම අදාලව පවතී. සැක කරුවන් බොහෝ දෙනෙකු අත් අඩංගුවට ගනු ලැබ සිටින හා අත් අඩංගුවට ගැනීම් දිගටම සිදුවන අතුණේදී "ආරක්ෂාව සැපයීමේ චිරාගත සේවාව ඉටු කිරීමට, එනම් දේශපාලන සිරකරුවන් හමුවී, ඔවුන් අඩස්සි කරනු ලැබ සිටින තත්වයන් ගැන බලධාරීනට රහස්‍ය රෙකමදාරු ඉදිරිපත් කිරීමට ජා.ර.කු.කමිටුවට අවසරදීම අවශ්‍යතාවයකි. උතුරේදී සහ නැගෙනහිරදී යුද සිරකරුවනට "ආරක්ෂාව" සැපයීමේ මෙන්ම, යුද්ධයෙන් විපතට පත්වූ සියල්ලටම, එනම් යුදබිමේදී තුවාල ලැබූවනට හෝ/යන සියලු දෙනාටම සහනාධාර සැපයීමේ සිය චිරාගත ද්විත්ව සේවාව ඉටු කිරීමට කමිටුවට අවසර දිය යුතුය.

ඇත්ත වශයෙන්ම, ජා.ර.කු. කමිටු නියෝජිතයන් මෙහි සිටියානම් මෙහි සිදුවූ භයානකම සිදුවීම් සමහරක් වළක්වා ගන්නට හැකියාව තිබිණි. ගැටුමෙහි සියලු පාර්ශවයන් ජිනීවා සම්මුති පිළිපැදීම සහතික කිරීමට උත්සාහ කිරීම ජා.ර.කු. කමිටුවේ කාර්යයයි. එය අපක්ෂපාත ආයතනයක් වන නිසා., අනෙක් අය අසමත් වන බොහෝ අවස්ථාවන්හදී පවා බලපෑමක් ඇති කිරීමට කමිටුව සමත්වන්නේය

ජා.ර.කු. කමිටුවේ වැදගත් කාර්යයක් වනුයේ දෙපාර්ශවය විසින්ම රඳවාගනු ලැබ සිටින යුද සිරකරුවන් හමුවීමටයාමත්, සිරකරුවන් හුවමාරු කැරගැනීමට සැලැස්වීම සහ ඔවුන් සියලු දෙනාටම ජිනීවා සම්මුතිවල විධිවිධාන අනුව සැලකීම සාමාන්‍යයෙන් සහතිකකිරීමය. ජා.ර.කු.කමිටුව මේ වන විටත් ශ්‍රී ලංකාවෙහි ක්‍රියාත්මකව තිබුණානම් පහත සඳහන් අවාසනාවන්ත සිද්ධීන් වළක්වා ගැනීමෙහි ලා යම් කාර්යභාරයක් ඉටුකිරීමට එයට තිබිණි. එයින් එක සිද්ධියක් නම් ශ්‍රී ලංකා හමුදා/ සටන්කාමීන් 17 දෙනාගෙන් වැඩි/ සිය දිවිනසා ගැනීමේ සිද්ධියයි. ඇල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් මාර්තුමාසයේ සිට සිරභාරයෙහි තබා ගෙන සිටි හමුදා භටයන් 8 දෙනා ඔක්: 5දා මරාදමනු ලැබීම එවැනි තවත් සිද්ධියකි. (එය කරන ලද්දේ ස්වේච්ඡාවෙන්ම සිය දිවි නසා ගැනීමේ සිද්ධියට පළි ගැනීමක් වශයෙන් බව කියනු ලැබේ ) එය, ශ්‍රී ලංකා හමුදාවත්, ඉන්දිය හමුදාව මෙන්ම ඇල්.ටී.ටී. සංවිධානයද පිළිපැදීමට බැඳී සිටින ජිනීවා සම්මුතිය [illegible] උල්ලංඝනය කිරීමකි.

අවුරුදු ගණනාවක් තිස්සේ දිග්ගැස්සෙමින් පවතින සිවිල් කලකෝලාහල අවසන් කිරීම අරමුණු කැරගත් සාම ගිවිසුම ක්‍රියාත්මක කිරීමේ ප්‍රයත්නයෙක යෙදෙන ශ්‍රී ලංකාව ඉන්දිය හමුදාභටයන් දහස්ගණනින් ස්වකීය භූමිය තුළට ගෙන්වා ගෙන තිබේ. ගැටුමෙන් විපතට පත්වූවනට ජා.ර.කු.කමිටුවේ ආධාර ලැබීම තව දුරටත් වැළැක්විමේ කිසිම සාධාරණකමක් දැන් නැත. එවැනි විපත් වලට ගොදුරුවන පුද්ගලයනටආධාර කිරීමේ විශේෂඥ පළපුරුද්දක් එම කමිටුවට තිබේ. ඉන්දියාව මෙන්ම ශ්‍රී ලංකාවද පාර්ශවයන් වන ජිනීවා සම්මුති විසින්ද ජා.ර.කු.කමිටුව නිශ්චිත ලෙසම පිළිගනු ලැබද තිබේ. යුද්ධයෙන් විපතට පත්වූවන් පුනරුත්ථාපනය කිරීමේ හා විනාශවූ ගම් බිම් යළි ඉදිකිරීමේ කටයුතුවලටද විශේෂඥ පළපුරුද්දක් ජා.ර.කු.කමිටුවට ඇති බැවින් උතුරේ වත්මන් යුද මෙහෙයුම් අවසන්වීමෙන් පසුව වුවද කමිටුව ක්‍රියාත්මකව තිබීම වැදගත්ය, ලෝක ප්‍රජාව විසින්ද දීර්ඝ කාලයක් තිස්සේ ඇවිටිලි කරන එවැනි පියවරක් ගත හොත් දිවයිනේ සියලු ප්‍රදේශවල ජනතාවදේශපාලන හෝ අනෙක් හෝ

කිසිම භේදයකින් තොරව එය ඉතා [illegible] අගයනු ඇත. ජා.ර.කු. කමිටුවේ ගරුත්වය හා අපක්ෂපාත [illegible] ඔවුන් විදේශිකයැයි අමනාපයක් දේශීය ජනතාව තුළ ජනිත නොවනුද [illegible] ය රටේ පුරවැසියන් දහස් ගණනකට සහන සැලැසීමට උපකාර වන මෙම [illegible] ල සහ ප්‍රායෝගික පියවර ගන්නා ලෙස ප්‍ර.අ.ආ.පෙරමුණ ආණ්ඩුවෙන් ඉතා [illegible] කමින් ඉල්ලා සිටී. "

ඉහත සඳහන් ප්‍රකාශනවල සම්පූර්ණ පිටපත් ලබා ගැනීමට කැමැති නම්, ඔබේ ලිපිනයත් මුද්දරයක් සහිත ලියුම් කවරයක් ප්‍රජා අයිතිවාසිකම් ආරක්ෂක පෙරමුණ, 16/1 දොන් කරෝලිස් පාර, කොළඹ 5, වෙත එවන්න.

UNIVERSITY OF SRI LANKA LIBRARY

3 වන ව්‍යවස්ථාව

අන්තර් ජාතික ස්වරූපයක්
නොගන්නා සටන්.

ගිවිසුමේ පාර්ශවයකට අයත් දේශ සීමාව තුල ඇතිවන අන්තර් ජාතික ස්වරූපයක් නොගන්නා අවි ගත් සටන් වලදී සටනේ සෑම පාර්ශවයක්ම අවම වශයෙන් පහත සඳහන් විධි විධාන පිළිපැදීමට බැඳී සිටී.

(1) පළ අවි බිම තැබූ හමුදා සාමාජිකයන් සහ ලෙඩ රෝග, තුවාල අත්අඩංගුවට ගැනීම, හෝ වෙනත් හේතුවක් හෝ නිසා සටන් කිරීමට නොහැකි වුවන්ද ඇතුළුව සටනේ ක්‍රියාකාරී ලෙස සහභාගී නොවන පැනැත්තන් හට ජාතිය, සමේ පාට, ආගම, භක්තිය, ස්ත්‍රී පුරුෂ භේදය, උපන් ස්ථානය හෝ ධනය හෝ වෙනත් එවැනි උපමානයක් මත පදනම්වූ අහිතකර වෙන් කිරීමක් නොමැතිව කාරුණිකව සැළකිය යුතුය.

මේ අරමුණ මුදුන්පත් කර ගැනීම සඳහා ඉහත සඳහන් කළ පුද්ගලයන් සම්බන්ධයෙන් කවර අවස්ථාවකදී හෝ කවර ස්ථානයකදී හෝ පහත දැක්වෙන ක්‍රියාවන් කිරීම තහනම් වේ.

එනම්, (අ) කවරාකාරයකින් හෝ මරණයට පත් කිරීම, අංග විකල කිරීම, කෲර ලෙස සැළකීම සහ වධ හිංසා පැමිණවීම ඇතුළුව ජිවිතයට හා ශරීරයට හානි සිදු කිරීම.

(ආ) ප්‍රාණ ඇපකරුත්වයට ගැනීම

(ඇ) අවමාන කිරීම හා පහත් ලෙස සැළකීමද ඇතුළුව පුද්ගලික ගෞරවයට හානි වන ක්‍රියාවලට ලක් කිරීම.

(ඈ) අත්‍යාවශ්‍ය යැයි ශිෂ්ඨ ජනතාව විසින් සළකනු ලබන සියළුම අධිකරණමය රක්ෂණයන් ලබා දෙන නිසි ලෙස සංස්ථාපිත අධිකරණයක් මගින් නිකුත් කරනු ලැබූ නඩු තීන්දුවක් නොමැතිව දඬුවම් පැමිණවීම හා මරණ දඬුවම ක්‍රියාත්මක කිරීම.

(2) තුවාලකරුවන් හා රෝගාතුරයන් රැස්කර රැකබලා ගත යුතුය.

රතු කුරුස සංවිධානයේ අන්තර් ජාතික කමිටුව වැනි අපක්ෂපාති, මිනිස් කමට ගරු කරන සංවිධානයක්, සටනේ පාර්ශවයන් හට තම සේවාවන් පිරිනැමීමට ඉඩ ඇත.

වර්තමාන ප්‍රඥප්තියේ අනෙකුත් විධි විධානයන් සියල්ලම හෝ ඉන් කොටසක් හෝ විශේෂ ගිවිසුම් මගින් ක්‍රියාත්මක කිරීමට සටනේ පාර්ශවයන් තව දුරටත් උත්සාහ කළයුතුය.

ඉහතකී විධි විධානයන් උපයෝගී කර ගැනීම මගින් සටනේ පාර්ශවයන්ගේ නෛතික තත්ත්වයට බලපෑමක් නොවිය යුතුය.

ගිවිසුමේ පාර්ශවයකට අයත් දේශ සීමාව තුල ඇතිවන අන්තර් ජාතික ස්වරූපයක් නොගන්නා අවි ගත් සටන් වලදී සටනේ සෑම පාර්ශවයක් ම අවම වශයෙන් පහත සඳහන් විධි විධාන පිළිපැදීමට බැඳී සිටී.

උප ලේඛනය 2

### ජාත්‍යන්තර රතු කුරුස කමිටුව ශ්‍රී ලංකාවට පිරිනැමීමට ඉදිරිපත්වූ ආධාර

( 1983 - 1985 වාර්ෂික වාර්තාවලින් උපුටා ගත් කොටස් )

ශ්‍රී ලංකාව 1983

ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ නියෝජිතයන් හමුවී සාකච්ඡා යළි ඇරඹීමටත්, ශ්‍රී ශ්‍රී ලංකාවේ රතු කුරුස සංගමය සමඟ, ජාත්‍යන්තර මානුෂික නීතිය ඉගැන්වීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමටත් නවදිල්ලියේ පිහිටි ජා.ර.කු. කමිටුවේ කලාපීය නියෝජිත මණ්ඩලයේ දෙදෙනෙක් අප්‍රේල් මාසයේදී කොළඹ ගියහ.

ජූලි මාසයේදී හටගත් ජාතිවාදී කරදර නිසා ජා.ර.කු. කමිටුව නවදිල්ලියෙන් සිය නියෝජිතයන් දෙදෙනකු කොළඹ යැවූයේ, අතරමංවූ සහ අඩස්සි ගත කැරුණු පුද්ගලයන්ගේ ආරක්ෂාව සහ ඔවුනටආධාර කිරීම සම්බන්ධයෙන් කමිටුව උනන්දුවක් දැක්වූ බැවිනි. ජූලි 29 දා කොළඹට ළඟාවූ නියෝජිතයෝ ජා.ර.කු. කමිටුවේ සේවාවන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට පිරිනමා සිටියහ. කොළඹ, නුවර, සහ යාපනය අසළ අනාථ කඳවුරුවල රඳවනු ලැබ සිටි අතරමංවූ පුද්ගලයනට අවශ්‍ය ඈ තක්සේරු කිරීමේ හා අත්අඩංගුවට ගැනුණු පුද්ගලයන් මුණගැසීමේ අවසරය ඔහු ඉල්ලා සිටියහ.

ඒ සමගම , ජා.ර.කු. කමිටුව ස්විස් ෆ්‍රෑන්ක් 1,9950 ක් වටිනා ආධාර ( ආහාර සහ බෙහෙත් ) තොගයක් ජූලි 19 ත් අගෝස්තු 3 ත් අතර කාලය තුළ ශ්‍රී ලංකාවට ගුවන් මඟින් යැවීය. එම හදිසි ආධාර ශ්‍රී ලංකාවේ රතු කුරුස සංගමයට බාර දෙනු ලැබීය. එම සංගමයේ කාර්ය මණ්ඩලය, විපතට පත්වූවනට ආධාර කිරීම ඒ වන විටත් අරඹා තිබිණි.

ජා. ර. කු. කමිටුව පිරිනමා තිබුණු සේවාවන් තමන් නොපිළිගන්නා බවත්, එබැවින් එම කමිටුවේ නියෝජිතයන් මෙහි රැඳී සිටීම තවදුරටත් අනවශ්‍ය බවත් ඒ අවස්ථාව වන විටත් කොළඹ සිටි, කමිටුවේ නියෝජිතයනට ශ්‍රී ලංකා බලධාරීහු අගෝස්තු 8 දා දැනුම් දුන්හ. එදිනම ජිනීවාහිදී නිවේදනයක් නිකුත් කළ ජා. ර. කු. කමිටුව එම තීරණය ගැන කනගාටුව පළ කෙළේය. ඒ සමඟම ඒ තීරණය තාවකාලික එකක් පමණක් වනු ඇතැයි බලාපොරොත්තුවූ කමිටුව, තමන් ආධාර පිරිනමන්නේ අනතුරට මුහුණ පා සිටින පුද්ගලයන් ආරක්ෂාව වර්ධනය කිරීම ප්‍රමුඛත්වය දිය යුතු කාර්යයක් ලෙසින් සළකා බව යළිත් ප්‍රකාශ කෙළේය. නියෝජිතයෝ අගෝස්තු 9 දා ශ්‍රී ලංකාවෙන් පිටත්ව ආහ.

## ශ්‍රී ලංකා 1984

ජා. ර. කු. කමිටුව 1984 දී ද, ශ්‍රී ලංකාවේ බලධාරීන් සමඟත් ශ්‍රී ලංකා රතු කුරුස සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් සමඟත් සබඳතා පවත්වාගෙන ගියේය. ජා. ර. කු. කමිටුවේ ආසියාව සඳහා වන මහ නියෝජිතවරයා, තවත් නියෝජිතයකු සමඟ මැයි මස මුලදී කොළඹ ගියේය. එහිදී හේ, ජාතික ආරක්ෂක ඇමැතිවරයා සමඟද, විදේශ කටයුතු හා අධිකරණ සහ අමාත්‍යාංශයන්හි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ හා ශ්‍රී ලංකාවේ රතු කුරුස සංගමයේ සභාපතිවරයා සමඟද සාකච්ඡා කෙළේය. රටේ පැවැති තත්ත්වය ගැනත්, එම තත්ත්වයන් යටතේ, ද්‍රව්‍යමය ආධාර සහ වෛද්‍ය ආධාර ක්ෂේත්‍රයේ මෙන්ම, රැකවරණ සැපැයීමේ ක්ෂේත්‍රයේ ද ජා. ර. කු. කමිටුවට ඉටු කළ හැකි කාර්යභාරය ගැනත් ඔහු සාකච්ඡා කළහ. ඔහු, යාපනයට ගොස් එහි ආකාර කඳවුරුවලටද ගියහ. මෙම නියෝජිතයෝ බලධාරීන් ද ශ්‍රී ලංකා රතු කුරුස සංගමයේ ශාඛාව ඇතුළු ප්‍රාදේශීය විවිධ සංවිධානයන්හි නියෝජිතයන් ද හමුවූහ.

අනතුරුව, ජා. ර. කු. කමිටුව ආධාර සහ රැකවරණ ( පුද්ගලයන් රඳවනු ලැබ සිටින ස්ථානවලට යාම ) මගින් සිය සේවාවන් යළි පිරිනමා සිටියේය. ශ්‍රී ලංකාවේ බලධාරීහු ප්‍රතිපත්තිමය වශයෙන් එයට එකඟවූහ. එහෙත් එයට අදාළ ක්‍රියා පරිපාටි වසර අවසාන වන අවස්ථාවේදී පවා සකස් කැර නොතිබිණි.

ජූනි 19 දා, ශ්‍රී ලංකාවේ රතු කුරුස සංගමයේ සභාපති අබේසේකර මහතා ජා. ර. කු. කමිටු මූලස්ථානයට පැමිණ කමිටුවේ සභාපතිවරයා මුණ ගැසුණේය .

OPEN UNIVERSITY OF SRI LANKA
LIBRARY

ශ්‍රී ලංකා 1985

ජා.ර.කු. කමිටුව, ආධාර සහ රැකවරණ ( පුද්ගලයන් රැඳවා ගනු ලැබ සිටින ස්ථානවල යාම ) මගින් සැපැයීමට පිරිනැමූ සිය සේවාවන් 1984 දී ද යළි පිරිනැමීමෙන් පසු ශ්‍රී ලංකාවේ බලධාරීන් සහ ශ්‍රී ලංකා රතු කුරුස සංගමය සමඟ සබඳතා දිගටම පවත්වා ගෙන ගියේය. සිද්ධීන් පිළිබඳ සිය සංවේගයත්, ගැටුම් නිසා විපතට පත්වූවනට ආධාර කිරීමට ඇති සිය කැමැත්තත් කමිටුව දිගටම ප්‍රකාශ කළේය. අප්‍රේල් මාසයේදී ජා.ර.කු. කමිටුවේ ආසියා සහ ශාන්තිකර කලාපයේ මහ නියෝජිතවරයා තවත් නියෝජිතයකු සමඟ කොළඹ යෑයේ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ජයවර්ධන මහතාත්, විදේශ ඇමැති හමීඩ් මහතා සහ අධිකරණ, පුනරුත්ථාපන සහ විදේශ යන අමාත්‍යාංශවල ඉහළ පෙළේ නිලධාරීනුත් සමඟ සාකච්ඡා පැවැත්වූයේය. ආධාර මගින් සිය සේවාවන් සැපැයීමට, විශේෂයෙන්ම රටේ උතුරට හා නැගෙනහිරට සහනාධාර යැවීමටත්, පවතින වෛද්‍ය සේවාව පෝෂණය කිරීමට මෙන්ම රැකවරණ සැපැයීමටත් හදිසි නීතිය යටතේ සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රැඳවා ගනු ලැබ සිටින පුද්ගලයන් හමුවීමටත්, කමිටුව පිරිනමන සේවාවන් පිළිගන්නා ලෙස යළි ඉල්ලා සිටීමට කමිටු නියෝජිතයනට මෙම සාකච්ඡාවන්හිදී හැකිවිය. කමිටුව, සිය සේවාවන් ක්‍රියාත්මක කිරීමට හැකි ක්ෂේත්‍ර විස්තර කැරෙන උපදේශකයක් ශ්‍රී ලංකාවේ බලධාරීන් වෙත ජූලි මාසයේදී එවූයේය.

මේ අතර, විදේශ ඇමැති හමීඩ් මහතා මාර්තු මාසයේදී වරක්ද, ජූලි මාසයේදී තවත් වරක්ද, සෞඛ්‍ය ඇමැති අතපත්තු මහතා මැයි මාසයේදී වරක් සහ ජාතික ආරක්ෂක ඇමැති ඇතුලත්මුදලි මහතා අගෝස්තු මාසයේදී වරක්ද ජිනීවා නුවරදී මුණගැසී සාකච්ඡා කිරීමට ජා.ර.කු. කමිටුවට අවස්ථාව ලැබිනි. තමන් පිරිනමන සේවාවන් පිළිගන්නා ලෙස යළි ඉල්ලා සිටීමට මෙමසාකච්ඡාවල දී කමිටුවට හැකිවිය.

කෙසේ වෙතත්, ස්වකීය මානුෂික කටයුතු ශ්‍රී ලංකාවේදී ක්‍රියාත්මක කිරීමේ අවසරය ජා.රැ.කු. කමිටුවට වසර අවසානයේදී පවා නොලැබිනි.

ශ්‍රී ලංකා 1986

යාපනය අර්ධද්වීපයේ යුද්ධමය කටයුතු උත්සන්න කිරීම නිසා විශේෂයෙන්ම නරක අතට හැරෙමින් තිබුණු ශ්‍රී ලංකාවේ තත්ත්වය ගැන දැඩි සංවේගයට පත්ව සිටි ජා.ර.කු. කමිටුව, ජාත්‍යන්තර මානුෂික නීතිරීති එම රටෙහි ක්‍රියාත්මක කැරැවීමේ අරමුණු ඇතිව ශ්‍රී ලංකා සමාජවාදී ප්‍රජාතන්ත්‍රික ජනරජයේ ආණ්ඩුව කීප වතාවක්ම කරුණු කියා සිටියේය. කමිටුව එම අරමුණු ඇතිව, යළි සිහිපත් කිරීමක් ද ප්‍රචණ්ඩ ක්‍රියා නිසා පීඩාවට පත්ව සිටින සිවිල් ජනයාට ආධාර සැපැයීමේදී සහ සිද්ධීන් නිසා අත්අඩංගුවට ගැනුණු පුද්ගලයනට ආරක්ෂාව සැපැයීමේදී ජා.ර.කු. කමිටුවෙන් ඉටුකළ හැකි මෙහෙය නිශ්චිතව විස්තර කිරීමත් එම ආධාර බාර ගන්නා ලෙස යළි ඉල්ලීමක්ද මැයි 19 වනදා ආණ්ඩුවට කෙළේය. වසර අවසානයේදීත් ආණ්ඩුව එම ඉල්ලීමට ප්‍රතිචාරයක් දැක්වූයේ නැත.

ශ්‍රී ලාංකික සන්නද්ධ හමුදා අදාළ ජාත්‍යන්තර මානුෂික නීතිය පිළිබඳ දැනුමක් පතුරුවාලීමේ වැඩ පිළිවෙලක් වාර්ධනය කිරීමේ අරමුණ ඇතිව ද ජා.ර.කු. කමිටුව කීපවතාවක්ම ඉදිරිපත් විය. එම ප්‍රචාරක කටයුතු බාර ජා.ර.කු. කමිටු නිලධාරියා කොළඹ දූත මෙහෙවරක යෙදී සිටි මැයි මාසයේදී ඉහල පෙළේ හමුදා හා පොලිස් නිලධාරියනට පාඩම් මාලා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට නිසිබලධාරීහු බාර ගත්හ. ජාත්‍යන්තර මානුෂික හඳුන්වාදීමේ පාඨමාලා දෙකක් නොවැම්බර් මස කොළඹදී පවත්වනු ලැබීය. සතියක් තුල එක පාඨමාලාව බැගින් පැවැති එම පාඩම් මලා දෙකට නාවික, ගුවන් භෞමික හමුදා සහ පොලිස් නිලධාරීන්ද ඇතුළු 34 දෙනෙක් සහභාගි වූහ. මෙම පන්ති පැවැත්වීමට ජිනීවා නුවරින් නියෝජිතයෝ තිදෙනෙක් එවනු ලැබූහ.

දෙමළ ප්‍රතිවාදී ව්‍යාපාරයේ අයටද ජාත්‍යන්තර මානුෂික නීතියේ ප්‍රතිපත්ති පිළිබඳ දැනුමක් ලබාදීම පිණිස ජා.ර.කු. කමිටුව නියෝජිතයෝ ඔවුන් ද හමුවූහ.

UNIVERSITY OF SRI LANKA
LIBRARY

## ශ්‍රී ලංකාවෙහි රට පෙර වතාවානුවේ ජා.ර.කු. කමිටු කටයුතු - 1971 - 1977

### 1971

ජා.ර.කු. කමිටුව නියෝජිතයෙක් අප්‍රේල් 25 වනදා කොළඹට යවනු ලැබීය. එහිදී හේ ශ්‍රී ලංකාවේ රතුකුරුස සංගමය සහ රජයේ බලධාරීන් මුණ ගැසුණේය. තුවාල කරුවනට පිළියම් කරන රෝහල්වෙත යාමට සහ සැකකරුවන් රඳවා ගනු ලැබ සිටින ස්ථාන වෙත යාමටත් ඔහුට සෑම පහසුකමක්ම ඔවුන්ගෙන් ලැබිණි. අප්‍රේල් 28 වනදා හේ , කොළඹ රෝහල් 4 ක් වෙත ගියේය. ඒවා නම්, කොළඹ මහ රෝහල, පොලිස් රෝහල, හමුදා රෝහල, සහ බන්ධනාගාර රෝහලයි. ඊට අමතරව ප්‍රධාන බන්ධනාගාරයටද හේ එදින ගියේ ය. ඊට පසු දින කීපය තුළ හේ කොළඹින් බැහැර ප්‍රදේශවලට ගොස්, වරකාපොළ සහ කෑගල්ල රෝහල්ද, මහනුවර බන්ධනාගාර රෝහලද, අනුරාධපුර බන්ධනාගාර රෝහලද, මාතර සහ ගාල්ල බන්ධනාගාර රෝහල්ද දෙනියාය, හම්බන්තොට සහ තිස්සමහාරාම රෝහලද නැරඹුවේය.

ජාතික රතු කුරුස සංගමය සමඟ සමීප සහයෝගයෙන් කළ මෙම පළමු ගමන් මාලාවේදී ජා.ර.කු. කමිටු නියෝජිතයා, අප්‍රේල් 5 වනදා සිද්ධීන් සම්බන්ධයෙන් රඳවා ගනු ලැබ සිටින පුද්ගලයන් 1800 ක් දෙනකු මුණ ගැසුණේය. ඉන් පසු හේ, බෙහෙත් සහ වෛද්‍ය උපකරණත්, සිරකරුවනට ඇඳුම් මැසීම සඳහා රෙදිපිළිත් ප්‍රධාන ආධාර එවන ලෙස ජා.ර.කු. කමිටුවෙන් ඉල්ලා සිටියේය.

තම නියෝජිතයා වාර්තා කළ අවශ්‍යතා සලකා බැලූ ජා.ර.කු. කමිටුව ලංකාවේදීම යම් යම් දෑ මිලට ගැනීමට තම නියෝජිතයාටත් ශ්‍රී ලංකා රතුකුරුස සංගමයටත් හැකිවනු පිණිස ප්‍රෑන්ක් 40,000ක් එව්ය. මෙම සිරකරුවනට ආධාර කරන ලෙස කමිටු ජූනි 18 දා රටවල් 20 ක රතු කුරුස සංගම්වලට ආයාචනයක් කෙළේය. එයට ප්‍රතිචාර වශයෙන් සංගම් පහක් ස්විස් ප්‍රෑන්ක් 15000 ක් පරිත්‍යාග කෙළේය.

ඒ අතරතුර, කමිටු නියෝජිතයා සිර කඳවුරු හා එවැනි අනෙක් ස්ථාන වෙත නොකඩවා යමින් සිටියේය. විද්‍යෝදය හා විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයන්හි රඳවා ගනු ලැබ සිටි සැක කරුවන් 5,300 දෙනකු හමුවීමට හේ මැයි 17 වනදා එම කඳවුරු වෙත ගියේය. ඒ ඔවුන් පුනුරුත්ථාපන කඳවුරු වෙත ගෙන යාමට පෙරය. අනුරාධපුරයේ ආරම්භ කැරුණු මුල්ම " පුනරුත්ථාපනය " කඳවුරු නැරැඹීමට හේ ජූනි 17 වනදා ගියේය. එහි සැක කරුවෝ 500 ක් සිටියහ.

ජුනි 21 වනදා ශ්‍රී ලංකාවෙන් පිටත්ව ගිය හේ සැප්තැම්බර් 17 වනදා යළි ශ්‍රී ලංකාවට ගියේය. එම දූත මෙහෙවර වෙනුවෙන් හේ 17 වනදා සිට 29 වනදා දක්වා ශ්‍රී ලංකාවෙහි නතරව සිටියේය. ඒ අවස්ථාව වන විට පුනුරුත්ථාපන කඳවුරුවල රඳවා ගනු ලැබ සිටි පුද්ගලයන් සංඛ්‍යාව 15,000 ක් පමණ විය. සේනපුර කඳවුරට ගිය හෙයෙම, එහි 600 ට අධික සිරකරුවනට ඇඳුම් ආදි ආධාර බෙදා දුන්නේය.

මෙම කඳවුරු වෙත ගිය ගමන්වල විස්තර වාර්තා බන්ධරයන් වෙත සුපුරුදු පරිදි යවනු ලැබිය. ඉන් අනතුරුව, ලංකාවේ රතු කුරුස සංගමයේ සභාපතිවරයා "පුනරුත්ථාපන" කඳවුරු කිපයක්ම වෙත ගොස් ජා.ර.කු. කමිටුවේ ආධාර නේවාසිකයනට බෙදා දුන්නේය.

1974 දි සිරකරුවන් 1,390 දෙනකු පමණ රඳවා ගනු ලැබ සිටි ස්ථාන 9 ක් වෙත ගියේය.

1975 දි රැඳවුම් ස්ථාන 3 ක වෙත ගියේය. ඒවායෙහි සිරකරුවෝ 1,200 ක් පමණ සිටියහ. ඔවුන් අතර දේශපාලන සිරකරුවෝ ද 300 ක් පමණ වූහ.

1977 දි රැඳවුම් ස්ථාන කිපයකටම යළි ගිය හේ ජනවාරි 26 වන දා කාලය තුළ, කොළඹ, යාපනය, අනුරාධපුරය සහ මහනුවර බන්ධනාගාර 4 ක් වෙත ද ගියේය. ඒවා තුළ "දේශපාලන සිරකරුවෝ" 260 දෙනෙක් පමණ වූහ. අනතුරුව පෙරළා ගිය හේ සැප්තැම්බරයේ දි යළි කොළඹ පැමිණ "නව මැගසින්" බන්ධනාගාරය නැරඹීමට ගියේය.

UNIVERSITY OF SRI LANKA
LIBRARY

උප ලේඛනය 5

## සන්නද්ධ ගැටුම්වලදී අදාළවන ජාත්‍යන්තර මානුෂික නීතියේ මූලධර්ම.

1. සටන් කිරීමට නොහැකි දුබල පුද්ගලයන්ගේ සහ සතුරු ක්‍රියාවන්හි සෘජු හස්තක්ෂේපයක් නොවන පුද්ගලයන්ගේ ජීවිතවලටද, ඔවුන්ගේ මානසික හා ශාරීරික ආරක්ෂාවටද ගරු කළ යුතුය. එය එම පුද්ගලයන් සතු අයිතියකි. සියලුම තත්ත්වයන් යටතේ ඔවුන් රැකගත යුතුය. කිසිම අයහපත් විශේෂත්වයකින් තොරව මානුෂික ලෙස ඔවුනට සැලකිය යුතුය.

2. යටත්වන කිසිම සතුරකු හෝ සටන් කිරීමට නොහැකි දුබල කිසිවකු හෝ මරා දැමීම හෝ එබැන්නකුට තුවාල සිදු කිරීම හෝ තහනම්ය.

3. තුවාලකරුවන් සහ රෝගීන් සිටින්නේ ගැටුමේ කවර පාර්ශවයක අණසක ඇතුළතද, එම පාර්ශවය ඔවුනට සත්කාර කළ යුතුය. රැකබලා ගත යුතුය. ආරක්ෂාව, වෛද්‍ය සේවාවේ පුද්ගලයනට ආයතනවලට, පරිවාහනවලට හා උපකරණවලටද අදාළය. රතු කුරුස ලාංඡනය හෝ රතු අඩ සඳ ලාංඡනය හෝ එම ආරක්ෂාවේ සංඥාවයි. එබැවින් ඒවාට ගරුකළ යුතුය.

4. විරුද්ධ පාර්ශවයක ආධිපත්‍ය යටතේ අල්ලා ගනු ලබන සටන්කරුවන් ගේ සහ සිවිල් පුද්ගලයන්ගේ ජීවිතයට, තත්ත්වයට, පෞද්ගලික අයිතිවාසිකම්වලට හා හෘද සාක්ෂියට ගරු කළ යුතු අතර, එය ඔවුන් සතු අයිතියකි. සියලු ප්‍රචණ්ඩ ක්‍රියා සහ පිළිගැනීම්වලින් ඔවුන් ආරක්ෂා කැරගත යුතුය. තම පවුල් සමඟ ලිපි ගනුදෙනු කිරීමේ හා ආධාර අයිතිය ඔවුනට හිමිවිය යුතුය.

5. අධිකරණය මඟින් සහතික කැර ඇති මූලික අයිතිවාසිකම්වලින් ඵලප්‍රයෝජන ලැබීමේ අයිතිය සියලු දෙනාටම හිමිවිය යුතුය. කිසිම පුද්ගලයකු, ඔහු විසින් සිදු නොකරන ලද ක්‍රියාවකට වගකීමට බැඳී නැත.

6. යුද ක්‍රම හා ශිල්ප තෝරාගැනීමේ අසීමිත වරයක් ගැටුමෙක පාර්ශවලට සහ ඔවුන් සන්නද්ධ හමුදාවල සාමාජිකයනටනැත. අනවශ්‍ය අලාභ හානි හෝ අධි දුක් පීඩා හෝ ගෙනදෙන අන්දමේ අවි හෝ ක්‍රම හෝ භාවිතය තහනම්ය.

7. ගැටුමෙක පාර්ශවයන්, සිවිල් ජනගහනය සහ ඔවුන්ගේ දේපල විනාශ නොවනු පිණිස සටන්කරුවන් සහ සිවිල් ජනයා අතර වෙනස සෑම කල්හිම තෝරා බේරා සිවිල් ජනගහනය හෝ සිවිල් පුද්ගලයන් හෝ ප්‍රහාරයෙක ඉල්ලක්කය කැර නොගත යුතුය. ප්‍රහාර එල්ල කළ යුත්තේ මුළුමනින්ම යුද්ධමය වස්තූන් වෙත පමණි.

මෙම පෙළ වූ කළී ජා.ර.කු. කමිටුවේ ප්‍රකාශනයක් වන " ජිනීවා සම්මුතිවල හා ඒවාට අදාළ අමතර ලියවිලිවල මූලධර්ම " නමැති කෘතියෙහි සාරාංශ කොට අන්තර්ගත කැරැ තිබෙන ජාත්‍යන්තර මානුෂික නීතියේ විධිවිධානවල ප්‍රධානම හරයයි. ජාත්‍යන්තර නීතිමය උපකරණයෙක බලය එයට නැත. එමෙන්ම එය, වලංගුව පවතිනා සම්මුති වෙනුවට කිසිම අයුරෙකින් ආදේශ කිරීමට අදහස් කරන ලද්දක්ද නොවේ. එය සකස් කැර තිබෙන්නේ ජාත්‍යන්තර නීතිය ප්‍රචාරය කිරීමට පහසුවන අන්දමටය.

## 1987 - 61 ශ්‍රී ලංකාවේ පවතින තත්ත්වය

මානුෂික අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය සහ යුධ පීඩිතයන් පිළිබඳ අන්තර් ජාතික නීතියේ විශ්ව සම්මත රීතීන්හි මඟ පෙන්වීම යටතේ ,

වර්ෂ 1984 මාර්තු මස 14 වෙනි දිනැති කොමිසමේ 1984/111 දරණ තීරණය සිහිකරමින්,

වද හිංසා කිරීම් පිළිබඳව විශේෂ ප්‍රකාශකයේ වාර්තාව ( ඊ/සී එන්4/1987/13 ) සහ පුද්ගලයන් බලහත්කාරයෙන් හෝ අකමැත්තෙන් අතුරුදහන්වීම පිළිබඳව ක්‍රියාකාරී කණ්ඩායමේ වාර්තාව (ඊ/සීඑන් 4/1987/15 ) සැළැකිල්ලට ගනිමින්,

මානුෂික අයිතිවාසිකම් පිළිබඳ කොමිසම,

1. විශ්ව සම්මත යුධපීඩිතයන් පිළිබඳ නීතියේ රීතීන්ට ගරු කරන ලෙස සියළුම පක්ෂ සහ කණ්ඩායම් වලින් ඉල්ලාසිටී.

2. බලය පාවිච්චි කිරීම සහ සාහසික ක්‍රියා අත්හැර දමා සාකච්ඡා මාර්ගයෙන්, මානුෂික අයිතිවාසිකම් හා මූලික නිදහසට ගරු කරන ප්‍රතිපත්ති මත පදනම් වූ දේශපාලන විසඳුමක් ලබා ගැනීමට උත්සහ කරන ලෙස සියලුම පක්ෂ සහ කණ්ඩායම් වලින් ඉල්ලා සිටී.

3. රතු කුරුස සංවිධානයේ අන්තර් ජාතික කමිටු සමඟ සබඳතා දැඩි කර ගනිමින් යුධ පීඩිතයන් පිළිබඳ අන්තර් ජාතික නීතිය ව්‍යාප්ත කිරීමට හා ප්‍රචලිත කිරීමටද සියළුම පක්ෂ වලට අයත් පීඩිතයන්ගේ ආරක්ෂාව හා ඔවුනට උපකාරවීමද ඇතුළුව පීඩිතයන්ගේ තත්ත්වය හා සිටුවීම සඳහා රතු කුරුස සංවිධානයේ අන්තර් ජාතික කමිටුව විසින් ලබා දෙන සහය ලබා ගන්නා ලෙස ශ්‍රී ලංකා රජයට ආරාධනා කරයි.

4. ශ්‍රී ලංකාවේ රජය විසින් මානුෂික අයිතිවාසිකම් පිළිබඳ කොමිසමට මෙම ප්‍රශ්නය පිළිබඳ ප්‍රවෘත්ති නොකඩවාම සපයනු ඇතැයි බලාපොරොත්තු වේ.

( ඒකඡන්දයෙන් සම්මත කරගන්නා ලදි )     58 වැනි රැස්වීම